# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/20 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ**

104ආ(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන

අවසන්වරට 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන මාධ්‍ය උපමාන මතු දැක්වෙන උපලේඛන 01, 02 හා 03 හි සඳහන් වේ.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 25 දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

## උපලේඛන අංක - 01

01. මාධ්‍ය උපමාන බලාත්මක කිරීම හා නිර්දේශ ලබා දීමේ (නිත්‍ය) නියෝජිත කමිටුව හා පොදු කරුණු

1.1 සෑම මාධ්‍ය ආයතනයක්ම ස්වකීය ප්‍රවෘත්ති විකාශ, පුවත්පත් සිරස්තල ඉදිරිපත් කිරීමේ දී සහ දේශපාලන කටයුතු හා සම්බන්ධ වෙනත් වැඩසටහන් ප්‍රචාරය හෝ විකාශය කිරීමේ දී හෝ ප්‍රසිද්ධියට පත් කිරීමේ දී නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාති තොරතුරු ලබා දිය යුතු වේ. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරන ලද මතු දැක්වෙන මාධ්‍ය උපමාන නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න සහ විද්‍යුත් මාධ්‍යවල අපක්ෂපාතීත්වය පිළිබඳ නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීමේ (නිත්‍ය) නියෝජිත කමිටුවක් පත් කරනු ලබන්නේ ය. මෙම කමිටුව මැතිවරණ කොමිෂන් සභාවේ විධාන හා උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු අතර, එකී කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බලා අවශ්‍ය තීරණ ගැනීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. මෙම කමිටුවේ සංයුතිය හා සාමාජිකයන් කොමිෂන් සභාව විසින් මැතිවරණ දින ප්‍රකාශ කිරීමෙන් පසුව නිවේදනය කරනු ලබන්නේය.

1.2 මෙම මාධ්‍ය උපමානවල "ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් හෝ පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, ඒ ජනමත විචාරණයේ හෝ ඡන්ද විමසීමේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වන්නේ ය.

## උපලේඛන අංක - 02

02. විද්‍යුත් මාධ්‍ය ආයතන, අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් සඳහා වන උපමාන

2.1 සෑම රූපවාහිනී ආයතනයක්ම සහ ගුවන්විදුලි ආයතනයක්ම යම් මැතිවරණයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී මධ්‍යස්ථ සහ අපක්ෂපාතී විය යුතු වන අතර තරග කරනු ලබන යම් දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට අගතියක් සිදු නොවන පරිදි හා වාසිදායක තත්ත්වයක් ඇති නොවන පරිදි දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට ගුවන්විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ගුවන් කාලය ලබා දීම කළ යුතු වේ.

2.2 ප්‍රවෘත්ති පත්‍ර වල කර්තෘ වාක්‍ය සහ සෙසු වාර්තා පිළිබඳ විද්‍යුත් මාධ්‍ය මගින් අදහස් දැක්වීම්වලදී කිසිදු දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් හෝ ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන අයුරින් අදහස් නොදැක්විය යුතු ය. කර්තෘ මතය ප්‍රචාරය කිරීම හෝ විකාශය කිරීම කරනු ලබන කවර හෝ අවස්ථාවක දී ඉන් අගතියට පත් පාර්ශ්වයට හා එම මතයට විරුද්ධව ඉදිරිපත් කරන කරුණු ප්‍රචාරය කිරීමට හෝ විකාශය කිරීමට සමාන අවස්ථා ලබා දිය යුතු ය.

2.3 රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකාවක වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන හෝ නිවේදනය කරනු ලබන සෑම තැනැත්තකුම, පුවත්පත් සිරස්තල සහ කාටූන් විස්තර ඉදිරිපත් කිරීමේ දී එක් පාර්ශ්වයක් ප්‍රවර්ධනය කරන හෝ තවත් පාර්ශ්වයක් අගතියට පත්වන අයුරින් සිය පුද්ගලික අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතු වේ.

2.4 යම් වැඩසටහනක්, සාකච්ඡාවක් හෝ ප්‍රවෘත්ති අංගයක් මැතිවරණ නීති සහ මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමානවලට අනුකූල නොවන්නේ නම් මැතිවරණ කාල සීමාව තුළ දී එවැනි පක්ෂග්‍රාහී වැඩසටහනක් හෝ සාකච්ඡාවක් ප්‍රචාරය හෝ විකාශය නොකිරීම සියලු විද්‍යුත් මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති සහ කාලීන වැඩසටහන් අංශවල වගකීම වන්නේ ය.

2.5 මැතිවරණ කාලසීමාව තුළ දී යම් සිද්ධියක් හෝ සිදුවීමක් ආවරණය කරමින් ඒ පිළිබඳව කරුණු එක් පක්ෂ/ස්වාධීන කණ්ඩායම් නියෝජිතයකු හෝ අපේක්ෂකයකු විසින් සිදු කරන අදහස් දැක්වීම් සහිතව ප්‍රචාරය කිරීමේ දී හෝ විකාශය කිරීමේ දී එම සිද්ධිය ගැන උනන්දුවක් හෝ සැලකිල්ලක් දක්වන හෝ එම කරුණු මගින් බලපෑමට ලක්විය හැකි වෙනත් යම් පක්ෂයකට/ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට ද එම සිද්ධිය හෝ සිදුවීම පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

2.6 මැතිවරණ කාලසීමාවක් තුළ ප්‍රචාරය හෝ විකාශය කරනු ලබන මැතිවරණයට සෘජුවම සම්බන්ධවන යම් වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩසටහනක් ප්‍රචාරය හෝ විකාශය කිරීමේ දී පිටපත් රචක, නිවේදක හා සංස්කාරකවරයාගේ නම් හෙළිදරව් කළ යුතු ය. එම තොරතුරු හෙළිදරව් නොකිරීමේ අයිතිය යම් මාධ්‍ය ආයතනයක් විසින් රඳවා තබා ගන්නේ නම්, එම අවස්ථාවේ දී එම වැඩසටහන භාරව සිටින නිලධරයා එම වැඩසටහනේ අන්තර්ගතය පිළිබඳ වගකීම භාරගත යුතු ය.

2.7 යම් මැතිවරණයක දී තරග කරන පක්ෂයකට/ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට විරුද්ධව තහවුරු කළ නොහැකි සහ නිරවද්‍යතාව ඔප්පු කළ නොහැකි චෝදනා, යම් වැඩසටහනක දී හෝ ප්‍රවෘත්ති විකාශය අතරවාරයේ දී ප්‍රචාරය හෝ විකාශය කිරීමෙන් සියලු මාධ්‍ය ආයතන වැළකී සිටිය යුතු ය. තමන් සම්බන්ධයෙන් වෙනත් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් කරන ලද ප්‍රකාශයක් අසත්‍ය හෝ අගතිදායක බවට යම් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු කියා සිටින්නේ නම් එම ප්‍රකාශයට විරුද්ධව කරුණු දැක්වීමට එකී පක්ෂයට, ස්වාධීන කණ්ඩායමට හෝ අපේක්ෂකයාට ගාස්තු ගෙවීමකින් තොරව අවස්ථාවක් ලබා දිය යුතු ය.

2.8 යම් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කරන හෝ අගතියට පත්විය හැකි ආකාරයේ යම් අපරාධයකට සම්බන්ධ වූ ප්‍රවෘත්තියක් ඕනෑම මාධ්‍ය ආයතනයක් විසින් පළකරන්නේ නම් එහි නිරවද්‍යතාව තහවුරු කරගැනීම සඳහා අදාළ සියලු පාර්ශවවලින් ද කරුණු විමසා සිටිය යුතු ය.

2.9 මැතිවරණ කාලසීමාව තුළ ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ යම් අමාත්‍යවරයකු විසින් මත හෝ අදහස් ප්‍රකාශ කරන අවස්ථාවක් ගුවන්විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ආවරණය කරන ලද අවස්ථාවක, එය එම තැනැත්තා නියෝජනයවන දේශපාලන පක්ෂයට දෙන ලද ආවරණයක් ලෙස සැළකිය යුතු ය. එහෙයින් එම මැතිවරණය තරග කරන යම් ප්‍රතිවාදී දේශපාලන පක්ෂයක් විසින් ඒ සඳහා නම් කරනු ලබන නායකයකුට ද වැඩසටහන්වල දී ගාස්තු ගෙවීමකින් තොරව ඒ හා සමාන අවස්ථාවක් ලබා දිය යුතු ය.

2.10 යම් පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයවන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයකු හට අගතියක් වන අයුරින් යම් අපේක්ෂකයකු වෙත විශේෂ හා වාසිදායක සැලකිල්ලක් දක්වා ගුවන්විදුලියේ හෝ රූපවාහිනියේ ගුවන් කාලය වෙන් කිරීම නොකළ යුතු ය.

2.11 මැතිවරණයක තරග වදින යම් පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන අයුරින් හෝ වෙනත් යම් අපේක්ෂකයකු අගතියට පත්වන අයුරින් රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වනු ලබන දේශන, සම්මුඛ සාකච්ඡා හා වෙනත් වැඩසටහන් ප්‍රසිද්ධියට පත් කිරීම හෝ විකාශය කිරීම මැතිවරණ කාලසීමාවේ දී නොකළ යුතු ය.

2.12 දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරීන්ගේ සක්‍රීය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරීන්ගේ මෙන්ම විශ්‍රාමික හමුදා නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන්ගේ නිල ඇඳුමෙන් සැරසී ලබා ගන්නා ඡායාරූප හෝ ප්‍රකාශ, පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනයවන ආකාරයට හෝ අගතියට පත්වන ආකාරයට විකාශ කිරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීම නොකළ යුතු වේ.

2.13 කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගිවන්නන් තෝරාගැනීමේ දී සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන සහභාගිවන්නන්ගේ සංයුතිය තුලනයවන ආකාරයෙන් සාධාරණ ලෙස කටයුතු කළ යුතු ය. වැඩසටහනකට සහභාගිවන යම් තැනැත්තකු ප්‍රවීණත්වයක් නොදක්වන යම් භාෂාවක් යොදා ගනිමින් එම සහභාගිවන්නාට අගතියක්වන ආකාරයට වැඩසටහන මෙහෙයවීමෙන් යම් මාධ්‍ය ආයතනයක් වැළකිය යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබා ගන්නා තොරතුරු පළ නොකළ යුතු අතර, එවැනි ප්‍රශ්න කිසිවිටෙකත් නොඇසිය යුතු ය. සදාචාර විරෝධී හෝ ආගමික සංහිඳියාවට හෝ වාර්ගික සමගියට හානිවන ආකාරයේ ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙසට සහභාගිවන්නන්ට වැඩසටහනක් ආරම්භයේ දීම දැන්විය යුතු අතර සාකච්ඡාව අතරතුර දී එවැනි ප්‍රකාශ කරනු ලැබුවහොත් වැඩසටහන වහාම නැවැත්විය යුතු ය.

2.14 දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න හා තොරතුරු ලබා ගනිමින් පවත්වනු ලබන යම් වැඩසටහනක දී සියලුම අමතන්නන්ට, සදාචාර විරෝධී හෝ ආගමික සංහිඳියාවට හෝ වාර්ගික සමගියට හානිදායක නොවන අයුරින් හා මැතිවරණ නීතිවලට අනුකූලව ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න හා යෝජනාවලට සමාන අවස්ථා ලබා දිය යුතු ය. එවැනි වැඩසටහනක් මෙහෙයවනු ලබන සෑම තැනැත්තෙකුම සමබර නොවන්නා වූ එවැනි යම් වැඩසටහනක් සම්බන්ධයෙන් වගකිව යුතු ය.

2.15 යම් විද්‍යුත් මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂවරයකු හෝ මාධ්‍යවේදියකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටී නම් සහ සමබර ප්‍රවෘත්ති ප්‍රචාරයට හෝ විකාශයට එමගින් බැඳියාවන් අතර ගැටීමක් ඇතිවන අවස්ථාවක, එකී තැනැත්තා විසින් පහත සඳහන් කරුණු ආයතනයේ කළමනාකාරීත්වයට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(අ) එම පුද්ගලයාගේ දේශපාලන ක්‍රියාවල මැදිහත්වීමේ ස්වභාවය ;
(ආ) ආයතනයෙහි එම පුද්ගලයා දරන තනතුරු, සහ ;
(ඇ) වැඩසටහන් සංවිධානය කිරීමේ දී හෝ මෙහෙයවීමේ දී එම පුද්ගලයාගේ මැදිහත්වීමේ ප්‍රමාණය.

2.16 යම් පිළිගත් දේශපාලන පක්ෂයකට කිසියම් නිලයක් දරන යම් තැනැත්තකු හා මාධ්‍ය ආයතනයක සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක හෝ ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විට දී එකී තැනැත්තා යම් මැතිවරණයක අපේක්ෂකයකු වන්නේ නම් හෝ ඔහු නියෝජනය කරන පක්ෂය යටතේ සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් හෝ මැතිවරණයක දී තරග කරයි නම් හෝ එම තැනැත්තා මාධ්‍ය ආයතනයේ තමාට පැවරී ඇති කටයුතුවලින් තාවකාලිකව ඉවත් වී සිටිය යුතු ය. තව ද එකී තැනැත්තා /පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයකු වන්නේ නම් හෝ මැතිවරණයකදී තරග කරන පක්ෂයක ප්‍රධාන නිලයක් දරන තැනැත්තෙකු වන්නේ නම් ඔහු රූපවාහිනී හෝ ගුවන්විදුලි නාලිකාවක දේශපාලනමය ස්වභාවයේ වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකී සිටිය යුතු ය.

2.17 යම් මාධ්‍ය ආයතනයක් විසින් සංවිධානය කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගීවීම, දේශපාලන පක්ෂයක/ස්වාධීන කණ්ඩායමක යම් තැනැත්තෙකු විසින් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එසේ සහභාගී නොවීම තහවුරු කිරීම සඳහා එම මාධ්‍ය ආයතනය විසින් හිස් පුටුවක් ප්‍රදර්ශනය කිරීම හෝ එවැනි ජවනිකාමය තත්ත්වයක් නිර්මාණය කිරීම නොකළ යුතු ය. සහභාගීවන්නා නොපැමිණීම සම්බන්ධව සෘජු හා සරල නිවේදනයක් කිරීම යෝග්‍ය වේ.

2.18 මැතිවරණයක් පිළිබඳ මත විමසුමක ප්‍රතිඵල විකාශය කරන විද්‍යුත් මාධ්‍යයක් එම මත විමසුම පවත්වන ලද සංවිධානයේ නම හෝ එම කාර්ය පවරන ලද හා ඒ සඳහා මුදලින් ප්‍රතිපාදන ලබාදුන් ආයතන හෝ තැනැත්තාගේ නම, පර්යේෂණයේ / මත විමසුමේ අවශ්‍යතාව, ඒ සඳහා යොදා ගන්නා ලද ක්‍රම, නියදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ සමීක්ෂණය කළ කාලසීමාව සඳහන් කළ යුතු ය. තව ද, එම මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් පිළිබිඹුවන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතු ය.

2.19 යම් අපේක්ෂකයකු විසින්, තමා අයත් නොවන වෙනත් යම් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා යම් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක එම ප්‍රකාශ විකාශය කිරීම මගින් ඒවාට ප්‍රසිද්ධියක් ලබා නොදිය යුතු ය.

2.20 මැතිවරණ කොමිෂන් සභාවේ නිසි ලිඛිත අවසරයක් නොමැතිව යම් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ ඡායාරූප ගැනීම, වීඩියෝගත කිරීම නොකළ යුත්තේ ය. අනවසරයෙන් ලබා ගන්නා යම් ඡායාරූපයක් හෝ වීඩියෝ දර්ශනයක් විකාශය කිරීම විද්‍යුත් හෝ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය. මැතිවරණ කොමිෂන් සභාවේ අවසර ලබා ගැනීමෙන් පසුව ලබා ගන්නා ලද ඡායාරූප සහ දර්ශන පවා විකාශය කිරීම කළ යුත්තේ මැතිවරණය අවසන් වීමෙන් පසුව ය.

2.21 ඡන්ද විමසීම් දිනයට පෙරාතුව විකාශය කරන ලද, ප්‍රචාරය කරන ලද යම් අපේක්ෂකයෙකු විසින් මෙහෙයවනු ලැබූ හෝ අපේක්ෂකයකු පෙනී සිටි, යම් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කරන හෝ අගතියට පත් කරන යම් වෙළඳ දැන්වීමක්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්, විනෝදාත්මක වැඩසටහනක්, සංවර්ධන කටයුතු හෝ එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධ වැඩසටහනක්, චිත්‍රපටයක්, ටෙලි නාට්‍යයක්, සංගීත ප්‍රසංගයක් හෝ එවැනි ස්වභාවයක වෙනත් යම් වැඩසටහනක් ඡන්ද විමසීම් දිනට පෙරාතුවම පවතින නිහඬ කාලසීමාව තුළ දී විකාශය කිරීම, ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

2.22 මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් " නිහඬ කාලය" යනු ඡන්ද විමසීම පැවැත්වීමට නියම කරන ලද දිනයට පැය 48 කට පූර්වයෙන් ආරම්භ වී ප්‍රතිඵල ප්‍රකාශ කරන කාලය තෙක් කාලය යි. මෙම කාලය තුළ දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකු, ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන පරිදි කිසිදු ආකාරයක ප්‍රචාරක කටයුත්තක්

හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රසිද්ධ කිරීමක් සිදුකරනු නොලැබිය යුතුය. කෙසේ වුවද නිහඬ කාලය ආරම්භ වීමට පූර්වයෙන් වූ දිනයේ දී දේශපාලන පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලබන ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳව වාර්තා,එකී රැස්වීම් පැවැත් වූ දිනයට පසු දින ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති විකාශය කෙරෙන එක් අවස්ථාවක දී පමණක් තරග කරන පක්ෂවලට හෝ අපේක්ෂයන්ට සමාන කාලසීමාවක් ලැබෙන පරිදි ප්‍රචාරය කළ හැකි ය.

2.23 සෑම විද්‍යුත් මාධ්‍ය ආයතනයක්ම ආගමික විශ්වාස, ඇදහිලි, කථන භාෂා, වාර්ගිකත්වය, චාරිත්‍ර හා කුල ගෝත්‍ර ඇතුළු විවිධ හේතු පදනම් කර ගනිමින් ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරය හා නොඉවසනසුලු බව ඇති වන හෝ ඇති කරවන ආකාරයට ප්‍රචාරක කටයුතු විකාශය කිරීම, ප්‍රචාරය කිරීමෙන් වැළකිය යුතු ය.

2.24 සෑම විද්‍යුත් මාධ්‍ය ආයතනයක්ම, සමාජය තුළ හෝ දේශපාලන ක්‍රියාකාරීන් අතර වෛරී සහගත දේශපාලනයක් ප්‍රවර්ධනය වන ආකාරයේ කටයුතු විකාශය කිරීමෙන්, ප්‍රචාරය කිරීමෙන් වැළකිය යුතු ය.

2.25 සෑම විද්‍යුත් මාධ්‍ය ආයතනයක්ම, යම් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් වෙනත් පක්ෂයක/ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකු සම්බන්ධයෙන් අතීතයේ දී කරන ලද ප්‍රකාශයක් එම ප්‍රකාශය කරනු ලැබූ තැනැත්තාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නැවත පළ කිරීමෙන් හෝ නැවත විකාශය කිරීමෙන් වැළකිය යුතු අතර, තමා විසින් පෙරදී කරන ලද ප්‍රකාශය නැවත ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටින ලෙස අදාළ ප්‍රකාශක විසින් කරනු ලබන ඉල්ලීමක් සලකා බැලිය යුතු ය.

2.26 කවර හෝ මාධ්‍ය ආයතනයක් අනන්‍යතාව තහවුරුකර නොගත් තැනැත්තන්ගේ හෝ සංවිධානවල දැන්වීම් හෝ ප්‍රචාරණ හෝ ආවරණ නොකළ යුතු ය. එසේ සිදුකිරීමෙන් වන වගකීම අදාළ මාධ්‍ය ආයතන වෙත පැවරේ.

2.27 අවස්ථාවෝචිත පරිදි යම් ප්‍රකාශ හෝ ප්‍රවෘත්ති පළකරන, විකාශය කරන හෝ ප්‍රචාරය කරන යම් මාධ්‍ය ආයතනයකට සහ එම ප්‍රවෘත්ති හෝ ප්‍රකාශ කියවනු ලබන යම් තැනැත්තෙකුට යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ ප්‍රවෘත්තියක් විකාශය කිරීම හෝ ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් සමාන වගකීමක් පැවරෙන අතර, ඒ සම්බන්ධයෙන් වන නීති කෘත්‍යවලට ද ඔවුන් යටත් විය යුතු ය.

2.28 යම් ඡන්ද විමසීමක් පිළිබඳව ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව විසින් නිල වශයෙන් ප්‍රකාශ කරන තෙක් ඡන්ද විමසීම පිළිබඳ නිල නොවන ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුත්තේ ය.

2.29 සියලු රාජ්‍ය, අර්ධ රාජ්‍ය මාධ්‍ය ආයතන විසින් යම් දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කරනු පිණිස රාජ්‍ය දේපළ හා අරමුදල් යොදා ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට අලාභ සිදුවන හෝ යම් ආයතනයකට හානි වන ක්‍රියාවකින් වැළකිය යුතු ය. පෞද්ගලික මාධ්‍යද එසේ ක්‍රියා කළ යුතු වේ. මාධ්‍ය උපමාන කඩකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති දඬුවම්වලට අතිරේකව වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ ආයතනවල පනවා ඇති විනය ක්‍රියාමාර්ග ගත හැකි ය.

2.30 සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතනවල හිමිකරුවන් මෙම මාධ්‍ය උපමානවලින් බැඳී ක්‍රියා කළ යුතු වන අතර, අදාළ ආයතන ප්‍රධානීන් එම උපමානවලට අනුකූලව තම කාර්ය මණ්ඩල ක්‍රියාත්මක වන බවට වගබලා ගතයුතු ය.

2.31 යම් මැතිවරණයක ඡන්ද විමසීම් කාලසීමාවක් තුළ දී, මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව කටයුතු කිරීම සමාජ වෙබ් අඩවි හිමිකරුවන් හා සමාජ වෙබ් අඩවි පරිපාලකවරුන්ගේ ද කේබල් රූපවාහිනී නාලිකා හිමිකරුවන්ගේ ද වගකීම වන්නේ ය.

2.32 අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් කෘතීම බුද්ධිය අනුසාරයෙන් සාදන ලද පරිගණක වැඩසටහන් මගින් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන් හෝ මැතිවරණය හෝ සම්බන්ධයෙන් අසත්‍ය පුවත්, දුස්තොරතුරු සහ හිතා මතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරු ප්‍රචාරණයන් සිදුනොකිරීමට කටයුතු කළ යුතු ය.

2.33 අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් පූර්ව මැතිවරණ මත විමසීම්වලින් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන් අගතියට පත් වන ආකාරයෙන් වැරදි ජනමතයක් හුවා දැක්වීමට කටයුතු නොකළ යුතු ය.

2.34 අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් අපේක්ෂකයන්ගේ හෝ ඔවුන්ගේ පවුලේ අයගේ හෝ විකෘති කරන ලද ඡායාරූප, අසත්‍ය පුවත් හෝ පෞද්ගලික තොරතුරු හෝ අනුමැතියකින් තොරව ප්‍රචාරය කිරීම හෝ කරදරයක් වන ආකාරයට බලහත්කාරයෙන් පැතිරවීම හෝ සිදුකිරීම නොකළ යුතු ය.

2.35 අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් වෙනත් පුද්ගලයන් නමින් අසත්‍ය සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කරමින් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන් අගතියට පත්කරන ආකාරයට කටයුතු නොකිරීමට කටයුතු කළ යුතු ය.

2.36 අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන් හෝ මැතිවරණය හෝ සම්බන්ධයෙන් අසත්‍ය පුවත්, දුස්තොරතුරු සහ හිතා මතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරු ව්‍යාප්තියට සමාජ මාධ්‍ය මෙහෙයුම්කරුවන් යොදා නොගැනීමට සහ අසත්‍ය සමාජ මාධ්‍ය ගිණුම් හරහා වැරදි ජනමතයක් ඇති කරවීමට හෝ හුවා දැක්වීමට කටයුතු නොකළ යුතු ය.

2.37 පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් සම්බන්ධයෙන් වන අසත්‍ය පුවතක්, දුස්තොරතුරක් හෝ හිතාමතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරක් ප්‍රචාරණය කිරීම සිදුකරන බවට මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි ලද හොත් ඒ සම්බන්ධයෙන් වන විමසීම්වල පිළිතුරු ලබා දීමට සහ විෂයගත පුවත හෝ තොරතුර හෝ තම වෙබ් අඩවියෙන්, සමාජ මාධ්‍ය ගිණුමෙන් ඉවත් කිරීමට අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් විසින් කටයුතු කළ යුතු ය.

2.38 යම් ඡන්ද විමසීම් කාලසීමාවක් තුළ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමානවලට අනුකූලව කටයුතු කිරීම ශ්‍රී ලංකාව තුළ චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ (සැටලයිට්) විකාශන කටයුතු සිදුකරනු ලබන සියලුම රූපවාහිනී හා ගුවන්විදුලි හිමිකරුවන්ගේ හා ඒවායේ පරිපාලකවරුන්ගේ ද වගකීම වන්නේ ය.

2.39 ඡන්ද විමසීමේ කාලසීමාව තුළ දේශපාලනඥයින් හෝ වෙනත් තැනැත්තන් විසින් ප්‍රචණ්ඩ ක්‍රියා, මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් හා නීති විරෝධි ක්‍රියා අගයමින් හෝ සමාජ කණ්ඩායම් අතර කැළඹීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවන ආකාරයෙන් හෝ සිදුකරනු ලබන ප්‍රකාශන, කථා හෝ හඬපට විකාශනය කිරීමෙන් වැළකීමට සියලු මාධ්‍ය ආයතන කටයුතු කළ යුතු ය.

2.40 මෙම මාධ්‍ය උපමානවලින් ආවරණය වන හෝ ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් ගුවන්විදුලි, රූපවාහිනී හෝ අන්තර්ජාල/ සමාජ මාධ්‍ය වේදිකා යන ඕනෑම මාධ්‍යයක් හරහා සිදු කෙරෙන ප්‍රකාශ, වාර්තා හෝ ප්‍රචාර මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ පැවැත්වෙන මැතිවරණ/ ඡන්ද විමසීම් නීති හෝ වෙනත් ඕනෑම නීතියක් හෝ උල්ලංඝනය වේ නම් එවැනි ප්‍රකාශ, වාර්තා හෝ ප්‍රචාර විකාශය කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

2.41 මෙම මාධ්‍ය උපමානවලට අනුකූල වීම හා බැඳී සිටීම මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ හා සමාජ වෙබ් අඩවි පරිපාලකවරුන් හා භාවිත කරන්නන්ගේ ද යුතුකමක් පමණක් නොව වගකීමක් ද වන්නේ ය. මක් නිසා ද යත්, විකාශන සංඛ්‍යාත මහජනතාව සතු බැවින් සියළු පක්ෂ/ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයින්ට සම තරග බිමක් නිර්මාණය වන පරිදි නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වන හෙයිනි.

## උපලේඛන අංක - 03

### 3. මුද්‍රිත මාධ්‍ය ආයතන සඳහා වන මාධ්‍ය උපමාන

3.1 සෑම මුද්‍රිත මාධ්‍යයක්ම යම් මැතිවරණය සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී මධ්‍යස්ථ සහ අපක්ෂපාතී වියයුතු වන අතර, තරග කරනු ලබන යම් දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට අගතියක් හෝ ප්‍රවර්ධනයක් සිදුනොවන පරිදි දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට ප්‍රවෘත්ති පත්‍රයක ඉඩ වෙන්කර දීම කළ යුතු වේ.

3.2 යම් පුවත්පතක් සාකච්ඡාවක්, අතිරේකයක් හෝ ප්‍රවෘත්ති අංගයක් මැතිවරණ නීති සහ මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමානවලට අනුකූල නොවන්නේ නම් ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී එවැනි පක්ෂග්‍රාහී වාර්තා කිරීමක් හෝ අතිරේකයක් පළනොකිරීම සියලුම මුද්‍රිත මාධ්‍ය ආයතනවල වගකීම වන්නේ ය.

3.3 ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී යම් සිද්ධියක් හෝ සිදුවීමක් ආවරණය කරමින් ඒ පිළිබඳව කරුණු එක් අපේක්ෂකයකු විසින් සිදුකරන අදහස් දැක්වීම් සහිතව පළ කිරීමේ දී එම සිද්ධිය ගැන උනන්දුවක් හෝ සැලකිල්ලක් දක්වන හෝ එම කරුණු මගින් බලපෑමට ලක්විය හැකි වෙනත් යම් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද එම සිද්ධිය හෝ සිදුවීම පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීමට ගාස්තු ගෙවීමකින් තොරව අවස්ථාවක් ලබා දිය යුතු ය.

3.4 ඡන්ද විමසීම් කාලසීමාව තුළ ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ යම් අමාත්‍යවරයකුට මත හෝ අදහස් ප්‍රකාශ කිරීමට ලබාදෙනු ලබන අවස්ථාවක් එම තැනැත්තා අයත්වන දේශපාලන පක්ෂයට දෙන ලද ආවරණයක් ලෙස සැළකිය යුතු ය. එහෙයින් එම මැතිවරණයේ තරග කරන යම් ප්‍රතිවාදී දේශපාලන පක්ෂය විසින් නම් කළ නායකයකුගේ විශේෂ සාකච්ඡා ද ඒ අයුරින් ම මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පළ කිරීමේ දී සහ ප්‍රචාරක රැස්වීම් වාර්තා පළ කිරීමේ දී සියලු දේශපාලන පක්ෂවලට, ස්වාධීන කණ්ඩායම්වලට හා අපේක්ෂකයින්ට සමාන ඉඩක් හා ප්‍රමුඛතාවක් ලබා දිය යුතු ය.

3.5 යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයකු හට අගතියක් වන අයුරින් යම් අපේක්ෂකයකු වෙත විශේෂ හා වාසිදායක සැලකිල්ලක් දක්වා ප්‍රවෘත්ති පත්‍රවල ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතු ය.

3.6 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග වදින යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන අයුරින් හෝ වෙනත් යම් අපේක්ෂකයකු අගතියට පත්වන අයුරින් රාජ්‍ය නිලධාරින් සඳහා පවත්වනු ලබන දේශන, සම්මුඛ සාකච්ඡා හා වෙනත් අතිරේක පළ කිරීම ඡන්ද විමසීම් කාලසීමාවේ දී නොකළ යුතු ය.

3.7 දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරින්ගේ හා සක්‍රීය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරින්ගේ මෙන්ම විශ්‍රාමික ආරක්ෂක හමුදා නිලධාරින් හෝ පොලිස් නිලධාරින්ගේ නිල ඇඳුමෙන් සැරසී ලබාගන්නා ඡායාරූප හෝ ප්‍රකාශ, පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත් වන ආකාරයට මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පළ කිරීම හෝ ප්‍රසිද්ධියට පත්කිරීම නොකළ යුතුවේ.

3.8 සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගිවන්නන් තෝරා ගැනීමේ දී සියලුම මුද්‍රිත මාධ්‍ය ආයතන සහභාගිවන්නන්ගේ සංයුතිය තුලනය වන ආකාරයෙන් සාධාරණ ලෙස කටයුතු කළ යුතු ය. සාකච්ඡාවකට සහභාගි වන යම් තැනැත්තකු ප්‍රවීණත්වයක් නොදක්වන යම් භාෂාවක් යොදා ගනිමින් එම සහභාගිවන්නාට අගතියක් වන ආකාරයට සාකච්ඡා මෙහෙයවීමෙන් පසු වාර්තා පළකිරීමෙන් මුද්‍රිත මාධ්‍ය ආයතනය වැළකිය යුතු ය. සහභාගිවන්නන්ගේ සම්මුඛ සාකච්ඡා පිළිබඳ වාර්තා පළ කිරීමේ දී ද ඒවා එම තැනැත්තා ප්‍රවීණත්ව දක්වන භාෂාවෙන් පළ කළ යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබා ගන්නා තොරතුරු පළ නොකළ යුතු අතර, එවැනි ප්‍රශ්න කිසිවිටකත් නොඇසිය යුතු ය. සදාචාර විරෝධී හෝ ආගමික සංහිඳියාවට හෝ වාර්ගික සමගියට හානි වන ආකාරයේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසට සහභාගිවන්නන්ට සාකච්ඡාව ආරම්භයේ දී ම දැන්විය යුතු අතර, එවැනි අදහස් පළකළහොත් ඒවා වාර්තා නොකිරීමට වග බලා ගත යුතු ය.

3.9 යම් මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂවරයකු හෝ මාධ්‍යවේදියකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටී නම් සහ සමබර ප්‍රවෘත්ති, පළ කිරීමට එමගින් ළැබෑදියාවන් අතර ගැටීමක් ඇති වන අවස්ථාවක, එකී තැනැත්තා විසින් පහත සඳහන් කරුණු ආයතනයේ කළමනාකාරීත්වයට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(අ) එම පුද්ගලයාගේ දේශපාලන ක්‍රියාවල මැදිහත්වීමේ ස්වභාවය ;
(ආ) ආයතනයෙහි එම පුද්ගලයා දරන තනතුරු, සහ ;
(ඇ) ප්‍රවෘත්ති සහ පුවත්පත් අතිරේක සංවිධානය කිරීමේ දී හෝ සම්බන්ධීකරණය කිරීමේදී එම පුද්ගලයාගේ මැදිහත්වීමේ ප්‍රමාණය.

3.10 යම් පිළිගත් දේශපාලන පක්ෂයක කිසියම් නිලයක් දරන යම් තැනැත්තකු හා මාධ්‍ය ආයතනයක සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක හෝ ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විට දී එකී තැනැත්තා යම් මැතිවරණයක අපේක්ෂකයකු වන්නේ නම් හෝ ඔහු නියෝජනය කරන පක්ෂය යටතේ සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් හෝ මැතිවරණයේ / ඡන්ද විමසීමේ දී තරග කරයි නම් හෝ එම තැනැත්තා මාධ්‍ය ආයතනයේ තමාට පැවරී ඇති කටයුතුවලින් තාවකාලිකව ඉවත් වී සිටිය යුතු ය. තව ද එකී තැනැත්තා මැතිවරණයේ අපේක්ෂකයකු වන්නේ නම්

හෝ මැතිවරණයක දී තරග කරන පක්ෂයක ප්‍රධාන නිලයක් දරන තැනැත්තෙකු වන්නේ නම් ඔහු, මුද්‍රිත මාධ්‍යයක් සම්බන්ධයෙන් වනවිට, එකී මාධ්‍ය හරහා දේශපාලනමය ලිපිලේඛන පළකිරීමෙන් වැළකී සිටිය යුතු ය.

3.11 මැතිවරණය පිළිබඳ මත විමසුමක ප්‍රතිඵල පළ කරන මුද්‍රිත මාධ්‍යයක් එම මත විමසුම පවත්වන ලද සංවිධානයේ නම හෝ එම කාර්ය පවරන ලද හා ඒ සඳහා මුදලින් ප්‍රතිපාදන ලබාදුන් ආයතන හෝ තැනැත්තාගේ නම පර්යේෂණයේ / මත විමසුමේ අවශ්‍යතාව ඒ සඳහා යොදා ගන්නා ලද ක්‍රමය, නියදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ සමීක්ෂණය කළ කාලසීමාව වාර්තා කළ යුතු ය. තව ද, එම මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් පිළිබිඹු වන බව ද වාර්තා කළ යුතු ය.

3.12 යම් අපේක්ෂකයකු විසින්, තමා අයත් නොවන වෙනත් යම් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා යම් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක එම ප්‍රකාශ පළ කිරීම මගින් ඒවාට ප්‍රසිද්ධියක් ලබා නොදිය යුතු ය.

3.13 මැතිවරණ කොමිෂන් සභාවේ නිසි ලිඛිත අවසරයක් නොමැතිව යම් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ ඡායාරූප ගෙන ප්‍රසිද්ධ නොකළ යුත්තේ ය. අනවසරයෙන් ලබා ගන්නා යම් ඡායාරූපයක් පුවත්පත්වල පළ කිරීම හෝ වෙනත් මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය. මැතිවරණ කොමිෂන් සභාවේ අවසර ලබා ගැනීමෙන් පසුව හෝ වෙනත් ලබා ගන්නා ලද ඡායාරූප පළ කිරීම කළ යුත්තේ මැතිවරණය අවසන් වීමෙන් පසුව ය.

3.14 ඡන්ද විමසීම් දිනයට පෙරාතුව පළ කරන ලද යම් අපේක්ෂකයෙකු විසින් මෙහෙයවනු ලැබූ හෝ අපේක්ෂකයකු පෙනී සිටි, යම් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කරන හෝ අගතියට පත් කරන යම් වෙළඳ දැන්වීමක්, සාකච්ඡාවක්, සංවර්ධන කටයුතු හෝ එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධ සාකච්ඡා හා ප්‍රවෘත්ති හා එවැනි ස්වභාවයක වෙනත් යම් ප්‍රවෘත්තියක් ඡන්ද විමසීමේ දිනට පෙරාතුවම පවතින නිහඬ කාලසීමාව තුළ දී පළ කිරීම නොකළ යුතු ය. දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති සහ ලබාදුන් පොරොන්දුවල හොඳ නරක පිළිබඳව අවධානය යොමුකොට කල්පනා කර බැලීමට හා සලකා බැලීමට ඡන්ද දායකයාට හැකි වන පරිදි නිහඬ වාතාවරණයක් ඡන්ද විමසීම් දිනයට පෙර පැවතීම වැදගත් ලෙස සැලකෙන බැවිනි.

3.15 මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් " නිහඬ කාලය" යනු ඡන්ද විමසීම පැවැත්වීමට නියම කරන ලද දිනයට පැය 48කට පූර්වයෙන් ආරම්භ වී ප්‍රතිඵල ප්‍රකාශ කරන කාලය තෙක් කාලය යි. මෙම කාලය තුළ දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකු, ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන පරිදි කිසිදු ආකාරයක ප්‍රචාරක දැන්වීම් ප්‍රසිද්ධ කිරීමක් සිදු කරනු නොලැබිය යුතුය. කෙසේ වුවද නිහඬ කාලය ආරම්භවීමට පූර්වයෙන් වූ දිනයේ දී දේශපාලන පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලබන ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳව වාර්තා, එකී රැස්වීම් පැවැත් වූ දිනයට පසු දින ප්‍රකාශයට පත් කරන පුවත්පත්වලද අවසන් දින රැස්වීම්වල වාර්තා කිසිදු පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ සැලකිල්ලක් නොලැබෙන පරිදි ප්‍රසිද්ධ කළ හැකි ය.

3.16 සෑම මුද්‍රිත මාධ්‍ය ආයතනයක්ම ආගමික විශ්වාස, ඇදහිලි, කථන භාෂා, වාර්ගිකත්වය, චාරිත්‍ර හා කුල ගෝත්‍ර ඇතුළු විවිධ හේතු පදනම් කර ගනිමින් ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරය හා නොඉවසනසුලු බව ඇති වන හෝ ඇති කරවන ආකාරයට පුවත්පත් වාර්තා හෝ තොරතුරු පළ කිරීමෙන් වැළකිය යුතු ය.

3.17 සෑම මුද්‍රිත මාධ්‍ය ආයතනයක්ම, සමාජය තුළ හෝ දේශපාලන ක්‍රියාකාරීන් අතර වෛරී සහගත දේශපාලනයක් ප්‍රවර්ධනය වන ආකාරයේ කටයුතු පළ කිරීමෙන් වැළකිය යුතු ය.

3.18 කවර හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක් අනන්‍යතාව තහවුරුකර නොගත් තැනත්තන් හෝ සංවිධානවල දැන්වීම් හෝ ප්‍රචාරණ සඳහා ආවරණය ලබා නොදිය යුතු ය. එසේ පළකිරීමෙන් වන වගකීම අදාළ මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත පැවරේ.

3.19 සෑම මුද්‍රිත මාධ්‍ය ආයතනයක්ම, යම් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් වෙනත් පක්ෂයක අපේක්ෂකයකු සම්බන්ධයෙන් අතීතයේ දී කරන ලද ප්‍රකාශයක් එම ප්‍රකාශය කරනු ලැබූ තැනැත්තාගේ අනුමතිය ලබා ගැනීමෙන් තොරව නැවත පළ කිරීමෙන් වැළකිය යුතු අතර, තමා විසින් පෙරදී කරන ලද ප්‍රකාශය නැවත පළ කිරීමෙන් වැළකී සිටින ලෙස අදාළ ප්‍රකාශක විසින් කරනු ලබන ඉල්ලීමක් සලකා බැලිය යුතු ය.

3.20 අවස්ථාවෝචිත පරිදි යම් ප්‍රකාශ හෝ ප්‍රවෘත්ති පළකරන යම් මුද්‍රිත මාධ්‍ය ආයතනයකට සහ එම ප්‍රවෘත්ති හෝ ප්‍රකාශ පළ කරනු ලබන යම් තැනැත්තෙකුට යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ ප්‍රවෘත්තියක් පළ කිරීම සම්බන්ධයෙන් සමාන වගකීමක් පැවරෙන අතර, ඒ සම්බන්ධයෙන් වන නීති කෘත්‍යවලට ද ඔවුන් යටත් විය යුතු ය.

3.21 යම් මැතිවරණ ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව විසින් නිල වශයෙන් ප්‍රකාශ කරන තෙක් මැතිවරණයේ නිල නොවන ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුත්තේ ය.

3.22 සියලු රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ මුද්‍රිත මාධ්‍ය ආයතන විසින් යම් දේශපාලන පක්ෂයක්, කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කරනු පිණිස රාජ්‍ය දේපළ හා අරමුදල් යොදා ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට අලාභ සිදුවන හෝ යම් ආයතනයකට හානි වන ක්‍රියාවකින් වැළකිය යුතු ය. පෞද්ගලික මුද්‍රිත මාධ්‍ය ආයතන ද එසේ ක්‍රියා කළ යුතු වේ. මාධ්‍ය උපමාන කඩකිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති දඬුවම්වලට අතිරේකව වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ ආයතනවල පනවා ඇති විනය ක්‍රියාමාර්ග ගත හැකි ය.

3.23 සියලුම මුද්‍රිත මාධ්‍ය හිමිකරුවන් මෙම මාධ්‍ය උපමානවලින් බැඳී ක්‍රියා කළ යුතු වන අතර,අදාළ ආයතන ප්‍රධානීන් විසින් එම උපමානවලට අනුකූලව තම කාර්ය මණ්ඩල ක්‍රියාත්මක වන බවට වගබලාගත යුතු ය.

3.24 යම් මැතිවරණ/ ඡන්ද විමසීම් කාලසීමාවක් තුළ දී, මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව කටයුතු කිරීම සියලුම මුද්‍රිත මාධ්‍ය ආයතනයන්හී වගකීම වන්නේ ය.

3.25 මෙම මාධ්‍ය උපමානවලින් බැඳී සිටීම මුද්‍රිත මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ හා භාවිත කරන්නන්ගේ ද යුතුකමක් පමණක් නොව වගකීමක් ද වන්නේ ය. මක් නිසා ද යත්, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වන හෙයිනි.

3.26 මැතිවරණ/ ඡන්ද විමසීමේ කාලසීමාව තුළ දේශපාලනඥයින් හෝ වෙනත් තැනැත්තන් විසින් ප්‍රචණ්ඩ ක්‍රියා, මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් හා නීති විරෝධි ක්‍රියා අගයමින් හෝ සමාජ කණ්ඩායම් අතර කැළඹීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවන ආකාරයෙන් හෝ සිදු කරනු ලබන ප්‍රවෘත්ති, ප්‍රකාශන හා සාකච්ඡා පළ කිරීමෙන් වැළකීමට සියලු මුද්‍රිත මාධ්‍ය ආයතන කටයුතු කළ යුතුය.

3.27 මෙම මාධ්‍ය උපමානවලින් ආවරණය වන හෝ ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍ය හරහා සිදු කෙරෙන ප්‍රකාශ, වාර්තා හෝ ප්‍රචාර මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ බල පැවැත්වෙන මැතිවරණ නීති හෝ වෙනත් ඕනෑම නීතියක් හෝ උල්ලංඝනය වේ නම් එවැනි ප්‍රකාශ, වාර්තා හෝ ප්‍රචාර පළ කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

3.28 මාධ්‍ය ආචාර ධර්මවලට අනුකූල වීම සහ ඒවායින් බැඳී ක්‍රියා කිරීම සෑම මුද්‍රිත මාධ්‍ය ආයතනයකම වගකීම වන්නේ ය.

EOG 10 - 0062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.